**ජාතික ඩෙංගු මර්දන ඒකකය, සෞඛ්‍ය අමාත්‍යාංශය**
தேசிய டெங்கு தடுப்பு பிரிவு, சுகாதார அமைச்சு
National Dengue Control Unit, Ministry of Health

+94 11 2368416 | +94 11 2368417 | +9411 2369893 | ndcu2010@yahoo.com | director.ndcu@gmail.com | www.dengue.health.gov.lk


මගේ අංකය / எனது இல / My No. NDCU/AE/Media/110/2022

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 25 / 04/ 2023

## මාධ්‍ය නිවේදනය

මෙම වසරේ අප්‍රේල් 24 වන විට ඩෙංගු රෝගීන් 27,814ක් දිවයිනෙන් වාර්තා වී ඇති අතර බස්නාහිර පලාතෙන් පමණක් රෝගීන් 13,627ක් වාර්තා වී ඇත. මෙය සමස්ථ රෝගීන්ගෙන් 49%ක් වේ. ඉහලම රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වන ගම්පහ දිස්ත්‍රික්කයෙන් රෝගීන් 6,220ක්ද, කොළඹ දිස්ත්‍රික්කයෙන් රෝගීන් 5,794ක්ද, කළුතර දිස්ත්‍රික්කයෙන් රෝගීන් 1,613ක්ද වාර්තාවේ. මෙම තත්වය පසුගිය වසරේ මෙම කාලය තුල වාර්තා වූ ඩෙංගු රෝගීන් ප්‍රමාණය මෙන් දෙගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකි.

පසුගිය සති හතරක කාලය තුල ඩෙංගු රෝගීන් වාර්තා වීමේ වර්ධනයක් පෙන්නුම් කරයි. ඩෙංගු වැළැක්වීම සඳහා නොයෙකුත් ක්‍රියාකාරකම් සිදුකලද, දිනකට ඩෙංගු යැයි සැක කරන රෝගීන් 600ත් 700ත් අතර ප්‍රමාණයක් රෝහල් ගතව ප්‍රතිකාර ලබයි. මෙම තත්වය තවදුරටත් වර්ධනය වුවහොත්, නිරිත දිග මෝසම් වැසි සමයත් සමග බරපතළ ඩෙංගු වසංගත තත්වයක් ඇතිවීමේ අවදානමක් මතුව ඇත.

ඩෙංගු රෝග කාරක වෛරසය පතුරුවන ඊඩිස් වර්ගයේ මදුරු ඝනත්වයේ ඉහල යාමක් මෙන්ම, ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන සුලභව පවතින බවද, කීට විද්‍යා සමීක්ෂණ මගින් තහවුරු කර ඇත. පාසල්, රාජ්‍ය ආයතන, අධ්‍යාපන ආයතන, ඉදිකිරීම් වැඩබිම්, කර්මාන්තශාලා, ආගමික ස්ථාන හා පොදු ස්ථාන ඩෙංගු මදුරුවන් බෝවන ප්‍රදාන පරිශ්‍ර ලෙස හඳුනා ගෙන ඇත.

මෙම තත්වය තුල ඉදිරියේ ඇතිවිය හැකි ඩෙංගු වසංගත තත්වය අවම කිරීම සඳහා **බස්නාහිර පළාත තුල විශේෂ ඩෙංගු මර්දන සතියක් අප්‍රේල් 26 සිට මැයි 02 දක්වා** පැවැත්වීමට බස්නාහිර පළාත් ආණ්ඩුකාර කාර්යාලයත්, ජාතික ඩෙංගු මර්දන ඒකකයත්, බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයත් ඒකාබද්ධව කටයුතු සලසා ඇත.

මෙහිදී, සියළුම ආයතන සහ පරිශ්‍රයන් තුල ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන හඳුනාගෙන, ඒවා නිවැරදි කර මදුරුවන් බෝ නොවන ස්ථාන ලෙස පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ. මේ සඳහා බස්නාහිර පළාත තුල සියලු රාජ්‍ය ආයතන ඒකාබද්ධ යන්ත්‍රණයක් ඔස්සේ ක්‍රියාත්මක වේ.

මේ කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ප්‍රජා දායකත්වය ඉතා වැදගත් වන අතර, ඔබ ජීවත් වන නිවස තුළ හා අවට මදුරුවන් බෝවන ස්ථාන ඉවත් කිරීමට කටයුතු කල යුතුය. එයට අමතරව තමා රාජකාරි කරන ස්ථානය හා පොදු ස්ථානවල මදුරුවන් බෝවන ස්ථාන සොයා බලා ඉවත් කිරීමට කටයුතු කල යුතුය. එමෙන්ම ඔබ නිවසට, ආයතනයට පැමිණෙන නිරීක්ෂණ කණ්ඩායම් සඳහා ඔබගේ උපරිම සහයෝගය ලබා දීමට කටයුතු කරන්න. **ඩෙංගු පාලනය තිරසාරව පවත්වාගෙන යාම සඳහා සියලු පරිශ්‍ර අවම වශයෙන් සතියකට වරක් වත් පරීක්ෂා කොට මදුරුවන් බෝවන හෝ බෝවිය හැකි ස්ථාන හඳුනාගෙන ඒවා ඉවත් කිරීම හෝ නිවැරදි කිරීම අත්‍යාවශ්‍ය වේ.**

එමෙන්ම, ඔබට උණ සමග ඩෙංගු යැයි සැක කරන රෝග ලක්ෂණ පවතී නම් ඉක්මනින් ම රෝහලක් වෙත හෝ සුදුකම්ලත් වෛද්‍යවරයකු වෙත ප්‍රතිකාර සඳහා යොමු වීමත්, වෛද්‍ය නිර්දේශ මත ප්‍රතිකාර හා රසායනාගාර පරීක්ෂණ සිදුකිරීමත් සංකූලතා අවම කිරීම සඳහා ඉතා වැදගත් වේ.

වැඩි විස්තර සඳහා ජාතික ඩෙංගු මර්දන ඒකකයේ මාධ්‍ය කමිටුව අමතන්න (ඇමිණුම).

අධ්‍යක්ෂ/ ජාතික ඩෙංගු මර්දන ඒකකය


මහජන සෞඛ්‍ය සංකීර්ණය, 555/5, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05
பொது சுகாதார பணிமனைத் தொகுதி, 555/5, எல்விடிகல வீதி, நாராகேன்பிட்டி, கொழும்பு 05
Public Health Complex, 555/5, Elvitigala Mawatha, Narahenpita, Colombo 05

ඇමිණුම

**ජාතික ඩෙංගු මර්දන ඒකකයේ මාධ්‍ය කමිටුව**

1. ප්‍රජා වෛද්‍ය විශේෂඥ නිමල්කා පන්නිල හෙට්ටි - 0714392953
2. ප්‍රජා වෛද්‍ය විශේෂඥ ජගත් අමරසේකර - 0779030706
3. ප්‍රජා වෛද්‍ය විශේෂඥ අනෝජා ධීරසිංහ - 0773678694
4. වෛද්‍ය ඉංදික වීරසිංහ - 0712259210
5. වෛද්‍ය ළහිරු කොඩිතුවක්කු - 0777035153